සියලු ම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All Rights Reserved |

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# වර්ෂ අවසාන ඇගයීම - 2012
# வருட இறுதிக் கணிப்பீடு - 2012
# Year End Assessment - 2012

| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | බුද්ධ ධර්මය I හා II පත්‍රය<br>பௌத்த சமயம் பகுதி I - II<br>Buddhism Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>*Two Hours* |
|---|---|---|

නම/විභාග අංකය.....................................................
සැලකිය යුතුයි.

i කොටස සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලකුණු 2 බැගින් 2 × 20 ලකුණු 40 කි.

---

- 1සිට 5 දක්වා වගන්ති හරිනම් (✓) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද යොදන්න.

(1) මනෝ විද්‍යාත්මක නියාම ධර්මය චිත්ත නියාමය නමින් ද හැඳින්වේ. ☐

(2) ලාභ අලාභ යස අයස ආදිය අටලෝ දහමට අයත් වේ. ☐

(3) කාව්‍ය ශේඛරය තොටගමුවේ රාහුල හිමියන්ගේ කෘතියකි. ☐

(4) අලංකාර කිරීම පිරිසිදු කිරීම ආදිය දස පුණ්‍ය ක්‍රියාවල පත්තිදානයට අයත් වේ. ☐

(5) අලසකම පුද්ගලයෙකුගේ දියුණුවට බලපාන සාධකයකි. ☐

- වරහන් තුළ ඇති පිළිතුරු නිවැරදි ලෙස භාවිත කරමින් පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

(15, 12, 3, 5, 8)

(6) ආර්ය මාර්ගයෙහි උතුම් වූ අංග ...................... කි.

(7) කරණීය මෙත්ත සූත්‍රයෙහි ඇතුළත් ගුණාංග සංඛ්‍යාව ...................... කි.

(8) චතුරාර්ය සත්‍යයේ සඳහන්ව ඇත්තේ ආකාර ...................... කි.

(9) බුද්ධ කාලයෙහි චිරප්‍රසිද්ධව සිටි ජටිලයන් ...................... දෙනෙකි.

(10) පංචවග්ගිය භික්ෂූන් යනු ...................... දෙනෙකුගෙන් යුත් තවුස් කණ්ඩායමකි.

- අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවල (අ) කොටසට අදාළ පිළිතුර (ආ) කොටසින් තෝරා යා කරන්න.

| (අ) කොටස | (ආ) කොටස |
|---|---|
| (11) බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත් වූ ස්ථානය. | සමජීවිකතා. |
| (12) අය වැය සමව පවත්වා ගැනීම. | ඉවසීම. |
| (13) බුදුරජාණන් වහන්සේගේ නව අරහාදි බුදුගුණවලට අයත් වේ. | ලෝකවිදූය. |
| (14) ඇති තතු ඇති සැටියෙන් ප්‍රකාශ කිරීම. | බරණැස ඉසිපතනය. |
| (15) මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණකි. | තථ ලක්‍ෂණ. |

- **පහත සඳහන් බහුවරණ ප්‍රශ්නවල පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) බුද්ධ කාලයේ ඉවසීම පිළිබඳ ප්‍රසිද්ධියක් ලබා සිටියේ මේ තෙරුන් වහන්සේය.

(1) රාහුල තෙරණුවෝ. (2) මුගලන් තෙරණුවෝ.

(3) පුණ්ණ තෙරණුවෝ. (4) සැරියුත් තෙරණුවෝ.

(17) අපට පිළිපැදිය යුතු සිරිත් සහ පිළිපැදිය හැකි විරිත් පිළිබඳ උගන්වන පොත වන්නේ.

(1) ලෝවැඩසඟරාවයි. (2) ලෝකෝපකාරයයි.

(3) සිදත්සඟරාවයි. (4) සිරිත් මල්දමයි.

(18) තමා සතු සම්පත් විනාශ කරගන්නා පුද්ගලයින් සිව්දෙනෙකු පිළිබඳ තොරතුරු ඇතුළත් සූත්‍රය වන්නේ,

(1) කාලාම සූත්‍රයයි. (2) මංගල සූත්‍රයයි.

(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (4) රතන සූත්‍රයයි.

(19) ශ්‍රී ලංකාවට බුදු දහම ලැබුනේ,

(1) විජයබා රජතුමාගේ කාලයේදීය. (2) පණ්ඩුකාභය රජතුමාගේ කාලයේදීය.

(3) දෙවන පෑතිස් රජතුමාගේ කාලයේදීය. (4) දුටුගැමුණු රජතුමාගේ කාලයේදීය.

(20) පහත සඳහන් ක්‍රියාකරකම් අතරින් අට මහා පිංකම්වලට අයත් නොවන්නේ.

(1) අටපිරිකර පූජා කිරීමය. (2) ආවාස තනවා පූජා කිරීමය.

(3) ශ්‍රමදානය කිරීමය. (4) කඨින සිවුරු පූජා කිරීමය.

## 11 කොටස

සැලකිය යුතුයි.

★ පළමු ප්‍රශ්නය අනිවාර්යය.

★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

---

(1) පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල යටතේ තුන්වන වාරයට නියමිත බෞද්ධ නායකත්ව භූමිකාව යටතේ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම අළලා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඉහත ඇගයීමට අදාළව ක්ෂණික කතාවාරයක් පැවැත්වීම සඳහා ඔබ පන්ති කාමරය සැලසුම් කළ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2යි)

(ii) මෙම ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත් පෙළ පොතේ පාඩම නම් කර පාඩමේ සාරාංශය ලියා දක්වන්න.(පේළි 5 ක් පමණ) (ලකුණු 3යි)

(iii) ඔබ සිදුකළ ක්‍රියාකාරකමට අදාළව එම ජාතක කථාවෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 4යි)

(iv) මෙම ක්‍රියාකාරකමේදී ඔබ ලැබූ වින්දනය පැහැදිලි කරන්න. (ලකුණු 3යි)

(v) නැවත මෙවැනි වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ දී ඔබේ අවධානයට ලක්විය යුතු කරුණු 2 ක් සඳහන් කරන්න. (ලකුණු 4යි)

(2) (ලකුණු 16යි)

(i) මිගාරමාතා නමින් හඳුන්වන උපාසිකාව නම් කරන්න.

(ii) මිගාර මාතාව විවාහ වී යන මොහොතේ ඇයගේ පියා ඇයට දුන් අවවාද දහයෙන් 3 ක් නම් කර ඉන් දෙකක් පිළිබඳ කෙටියෙන් පහදන්න.

(iii) ඇයගේ චරිතයෙන් අප ජීවිතයට ගත හැකි ආදර්ශ දෙකක් අගය කරන්න

(3) (ලකුණු 2+ 3+ 6= 11 )

(i) ප්‍රථම ධර්ම සංගායනාව පවත්වන ලද ස්ථානය හා දායකත්වය දැරූ රජතුමා නම් කරන්න.

(ii) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ මූලික හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල 3 ක් පිළිබඳ ඇගයීමක් කරන්න.

(4) (ලකුණු 2+ 3+ 6= 11 )

(i) දිනපතා පිළිපැදිය යුතු සිරිත් තුනක් ලියන්න.

(ii) ආහාර ගැනීමේදී පිළිපැදිය යුතු සිරිත් 4 ක් සඳහන් කර ඉන් දෙකක් පැහැදිලි කරන්න.

(iii) සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමේදී වැසිකිළි භාවිතය චාරිත්‍රානුකූලව ක්‍රමවත් විය යුතුය මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 2+ 3+ 6= 11 )

(5)

(i) "එකේන භෝගේ භුඤ්ජෙය්‍ය" ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ අර්ථය පැහැදිලි කරන්න.

(iii) ඔබට ලැබෙන ධනය නිවැරදිව පරිහරණය කළ යුතු අකාරය බුදුදහමට අනුව ගලපා ලියන්න.

(ලකුණු 2+ 3+ 6= 11 )

(6)

(i) "උට්ඨානවතෝ සතිමතෝ" යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එහි අර්ථය සරල බසින් ලියන්න.

(iii) මෙම ගාථාවෙන් කියවෙන උපදේශ පුද්ගල දියුණුවට මහෝපකරී වෙයි. කරුණු 3 ක් මගින් මෙම අදහස තහවුරු කරන්න.

(ලකුණු 2+ 3+ 6= 11 )

(7)

(i) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය පැහැදිලි වන සූත්‍ර දෙක නම් කරන්න

(ii) ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) උදාර ජීවිතයක් සඳහා සිල්වත් වීම අත්‍යවශ්‍යය. බෞද්ධ දරුවකු ලෙස මෙම අදහස අගය කරන්න.

(ලකුණු 2+ 3+ 6= 11 )

e තක්සලාව